# ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලයීය
# මුද්‍රණාලය සඳහා
# තාවකාලික පදනම මත යන්ත්‍ර ක්‍රියාකරු තනතුර සඳහා බඳවා ගැනීම

- ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලයේ පහත සඳහන් තනතුර සඳහා සුදුසුකම් සපුරා ඇති අයවලුන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.
- පත්වීම් තාවකාලික පදනම මත වන අතර පැමිණීම මත පදනම් වූ දෛනික දීමනාවක් ගෙවනු ලැබේ.
- වැඩ, හැසිරීම හා පැමිණීම මත සේවයේ නැවත පිහිටුවීම් සඳහා සලකා බලනු ලැබේ.
- විශ්වවිද්‍යාලයීය ආකෘතියට අනුව පිළියෙල කල අයදුම්පත් සහතික කල අධ්‍යාපන / වෘත්තීය සුදුසුකම් සහතික සමඟ ලේඛකාධිකාරී, ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලය, රත්මලාන යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් හෝ ගෙනවිත් භාරදිය හැකිය.
- අයදුම්පත් භාර ගන්නා අවසන් දිනය 2023.04.03

## තෝරාගැනීමේ ක්‍රමවේදය

- ප්‍රායෝගික පරීක්ෂණයක් හා සම්මුඛ පරීක්ෂණ ප්‍රතිඵල අනුව.

## පොදු කොන්දේසි

01. ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතුය.

02. අයදුම්කරුවන් තෝරා ගැනීම ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලය විසින් අනුමත බඳවා ගැනීමේ පරිපාටියට අනුකූලව සහ සම්මුඛ පරීක්ෂණ ප්‍රතිඵල පදනම් කරගෙන සිදු කරනු ලැබේ.

03. අවශ්‍ය සුදුසුකම් සම්පූර්ණ කර ඇති අයදුම්කරුවන් පමණක් සම්මුඛ පරීක්ෂණ සඳහා කැඳවනු ලැබේ.

04. අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණයට කැඳවීමට පෙර ඔවුන් කෙටි ලැයිස්තු ගත කිරීමේ අයිතිය විශ්වවිද්‍යාලය සතුය.

05. කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාල වෙබ් අඩවියෙන් (www.kdu.ac.lk) භාගත කර ගත හැකි ආකෘතිය මගින් පමණක් අදාළ තනතුර සඳහා ඉල්ලුම් කරන ලෙස අයදුම්කරුවන්ට දන්වා සිටිනු ලැබේ. ප්‍රමාද වී ලැබෙන, අසම්පූර්ණ හෝ නියමිත ආකෘතියට පරිබාහිරව යොමු කරනු ලබන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

11/03/23

වීඩී කිත්සිරි
ලේඛකාධිකාරී

VD KITHSIRI
Registrar
General Sir John Kotelawala Defence University
Ratmalana

# 01. (තාවකාලික යන්ත්‍ර ක්‍රියාකරු)

## සුදුසුකම්

1. අධ්‍යාපන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේ දී දෙවරකට නොවැඩි වාර ගණනකදී සිංහල/දෙමළ/ඉංග්‍රීසි භාෂාව හෝ සාහිත්‍යය සහ අංක ගණිතය/ වාණිජ අංක ගණිතය/ගණිතය සමඟ විෂයන් හයකින් සමත්ව තිබීම සහ තාක්ෂණික ආයතනයක වසර තුන (03)ක මුද්‍රණ පාඨමාලාවක් සාර්ථකව හදාරා තිබීම සහ විශාල මුද්‍රණ ආයතනයක අදාළ ක්ෂේත්‍රයේ වසර අට (08) කට නොඅඩු පළපුරුද්ද තිබීම.

හෝ

2. අටවන (08) ශ්‍රේණිය සමත් වීම හෝ උසස් විභාග සමත්ව තිබීම සහ විශාල මුද්‍රණ ආයතනයක අදාළ ක්ෂේත්‍රයේ වසර දොළහකට නොඅඩු පළපුරුද්ද තිබීම.

3. අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට වයස අවුරුදු 40 නොඉක්මවිය යුතුය.

## දෛනික වැටුප

රු. 2,000/-ක දෛනික වැටුපක් ගෙවනු ලැබේ. (සේවයට පැමිණීම මත, මසකට වැඩ කරන දින 20ක් සඳහා දළ වැටුප රු. 40,000/- ක් ගෙවනු ලැබේ.)